සියලුම හිමිකම් ඇවිරිණි

කො/විශාඛා විද්‍යාලය කොළඹ - 05

**Co / Visakha Vidyalaya , Colombo - 05**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

General Certificate of education (Adv. Level) Examination

13 ශ්‍රේණිය තෙවන වාර පරීක්ෂණය - ජුනි 2018

Grade 13 - 3rd Term Test - 2018 June

ආර්ථික විද්‍යාව II

Economics II

21 | E | II

කාලය පැය 03

03 hours

**නම / විභාග අංකය :** ..............................................................................................

උපදෙස්:

**" අ "** උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද , **" ආ "** උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

### " අ " උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න)

**01.**

I. " ඕනෑම ආර්ථික පද්ධතියක් තුල තාක්ෂණික වශයෙන් ඉහළ නිෂ්පාදන මට්ටමක් අත්කරගැනීමෙන් හිඟකම විසඳා ගත හැකිය". මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? හේතු දක්වන්න.(ලකුණු 04)

II. එක්තරා ආර්ථිකයක් පවත්නා සියලු සම්පත් උපයෝජනය කරමින් ආර්ථිකය තුල තේ හා කම්ස නිෂ්පාදනය කරයි. එම ආර්ථිකයෙහි නිෂ්පාදනය සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.

| තේ නිෂ්පාදනය (ඒකක) | කම්ස කැප කරන ප්‍රමාණය (ඒකක) |
|---|---|
| 100 | 35 |
| 80 | 26 |
| 60 | 19 |
| 40 | 12 |
| 20 | 08 |
| 0 | - |

(අ). ඉහත තොරතුරු උපයෝගී කර ගනිමින් තේ නිෂ්පාදනය තිරස් අක්ෂයෙහි හා කම්ස නිෂ්පාදනය සිරස් අක්ෂයෙහි දැක්වෙන පරිදි නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය නිර්මාණය කරන්න.(ලකුණු 02)

(ආ). මෙම ආර්ථිකයට තේ ඒකක 100 ක හා කම්ස ඒකක 35කින් යුතු නිමවුම් සංයෝගයක් හිමි කරගැනීමට අවශ්‍ය වේ නම්, එම නිමවුම් සංයෝගය ළඟා කර ගැනීම සඳහා අනුගමනය කල හැකි ක්‍රියාමාර්ගයන් යෝජනා කරන්න.(ලකුණු 02)

III. යම් ආර්ථිකයකට තම විභව නිමැවුම ඉක්මවූ සැබෑ නිමවුමක් අත්පත් කර ගත හැකිද? උදාහරණ සහිතව පැහැදිලි කරන්න.(ලකුණු 04)

IV. සමාජවාදී වෙළඳපොළ ආර්ථිකයක් හා සමාජ වෙළඳපොළ ආර්ථිකයක් අතර දැකිය හැකි සමානකම් හා අසමානකම් පිලිබඳ සංසන්දනයක් කරන්න.(ලකුණු 04 )

V. නිෂ්පාදන හැකියා මායිම මත පිහිටි සෑම නිමැවුම් සංයෝගයක්ම ආර්ථික කාර්යක්ෂමතාවය නිරූපනය කරයිද? ඔබගේ පිළිතුරට හේතු විමසන්න. (ලකුණු 04)



Scanned by CamScanner

**02.**

I. එක්තරා භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

$$Q_d = 4000 - 25p$$
$$Q_s = 2000 + 50p$$

මෙම භාණ්ඩයේ නිෂ්පාදනය මත රු 5ක ඒකක බද්දක් පැනවූයේ යයි සිතන්න.

(අ). බද්දෙන් පසු සමතුලිත මිල හා ප්‍රමාණය කොපමණද?(ලකුණු 04)

( ආ). සැපයුම්කරුට ලැබෙන මිල කොපමණද?(ලකුණු 02)

(ඇ). උපරිම මිලක් පැනවීමේ අරමුණ සඳහන් කොට උපරිම මිලක් නියම කිරීම නිසා ඇතිවන ආර්ථික ප්‍රතිවිපාක දක්වන්න.(ලකුණු 04)

II. එක්තරා භාණ්ඩයක මිල, ඉල්ලුම් ප්‍රමාණය හා අධි ඉල්ලුම් ප්‍රමාණය දැක්වෙන වගුවක් පහත දැක්වේ.

| මිල | ඉල්ලුම් ප්‍රමාණය | අධි ඉල්ලුම් ප්‍රමාණය |
|---|---|---|
| 4 | 100 | 50 |
| 20 | 0 | −250 |

(අ). ඉහත ලේඛණය ඇසුරින් සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න. (ලකුණු 04)

(ආ).මෙම නිෂ්පාදනය මත ඒකකයකට රු.5ක සහනාධාරයක් සැපයීමට රජය තීරණය කළේ නම්, සහනාධාරයෙන් පසු නිෂ්පාදක හා පාරිභෝගික අතිරික්ත කොපමණද?(ලකුණු 04)

( ඇ). සහනාධාරය සැපයීම නිසා අහිමි වන සමාජ ශුභ සාධනය කොපමණද?(ලකුණු 02)

**03.**

I. සාමාන්‍ය භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණයේ හැසිරීම ආදේශන හා ආදායම් ප්‍රතිවිපාක ඇසුරින් විග්‍රහ කරන්න. (ලකුණු 04)

II. සැපයුම් වක්‍ර ඇසුරින් අනම්‍ය සැපයුම හා නම්‍ය සැපයුම අතර වෙනස හේතු සහිතව පෙන්වන්න. (ලකුණු 04)

III. "ඉල්ලුම් වක්‍රය වම්පසට විතැන්වීමට හේතු, සැපයුම් වක්‍රය වම්පසට විතැන්වීමට ද හේතුවේ". මේ ප්‍රකාශයට ඔබ එකඟ වේද? හේතු දක්වන්න. (ලකුණු 04)

IV. සහතික මිල ප්‍රතිපත්තිය හඳුන්වා දුන් පසු පාරිභෝගික අතිරික්තයේ හා නිෂ්පාදන අතිරික්තයේ හට ගන්නා වෙනස රූපසටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

V. වෙළඳ පොළ සමතුලිතය තීරණය කිරීමේ ලා ධන අධි ඉල්ලුම් ප්‍රමාණය හා සෘණ අධි ඉල්ලුම් ප්‍රමාණයේ කාර්යභාරය රූපසටහනක් ඇසුරින් විමසන්න. (ලකුණු 04)

**04.**

I. හීන වන ඵල නීතිය පැහැදිලි කරන්න. එම නීතිය සඳහා පදනම් කරගනු ලබන උපකල්පන කවරේද?(ලකුණු 04)

II. ගෘහ භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියක් පවත්වා ගෙන යන දසුන්ගේ ව්‍යාපාරයේ 2017.12.31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂයට අදාළ තොරතුරු පහත පරිදි වේ.

| | රු |
|---|---|
| 2017.01.01 දිනට ප්‍රාග්ධන වත්කම් | 200,000 |
| දැව හා ආලේපන | 100,000 |
| බැංකු ණය | 250,000 |
| වැටුප් හා වේතන | 75,000 |
| විදුලිය, ජල ගාස්තු හා අනෙකුත් වියදම් | 25,000 |
| ප්‍රාමාණික ලාභය | 10,000 |
| ගණකාධිකරණ ලාභය | 25,000 |
| 2017.12.31 දිනට ප්‍රාග්ධන වත්කම් | 175,000 |



Scanned by CamScanner

වෙනත් තොරතුරු:

- දසුන් විසින් මූලික ප්‍රාග්ධනය සම්පාදනය කරනු ලැබුවේ 10%ක් වාර්ෂික පොළියක් හිමි 300,000ක ස්ථාවර තැන්පතුව මගිනි.
- දසුන් තම පෞද්ගලික ව්‍යාපාරය නිසා මාසිකව රු. 10,000 , 12,000, 15,000 ලෙස ඉපයිය හැකි රැකියා සඳහා ලද ආරාධනා ප්‍රතික්ෂේප කරන ලදී.
- බැංකු ණය සඳහා වාර්ෂික පොළිය 20%කි.

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දසුන්ගේ ව්‍යාපාරයේ පහත දෑ ගණනය කරන්න.

(අ). ඍජු පිරිවැය

(ආ).ව්‍යාපාරයේ මුළු අයභාරය

(ඇ).වක්‍ර පිරිවැය

(ඈ).ආර්ථික ලාභය

(ලකුණු 02 × 4 = 08)

III. "මිල තීරණය කරන්නා" සහ " මිල ගනුවා" යන සංකල්ප වෙළඳ පොළ ව්‍යුහ ඇසුරෙන් විමසන්න.(ලකුණු 04)

IV. පූර්ණ තරඟකාරී ආයතනයක් ලාභ උපරිම කිරීමේදී සපුරා ලිය යුතු කොන්දේසි සෙසු ව්‍යාපාර ආයතනයක් ලාභ උපරිම කිරීමේ කොන්දේසි සමඟ සංසන්දනය කරන්න.(ලකුණු 04)

**05.**

I. විවෘත ආර්ථිකයක ජාතික ආදායමේ චක්‍රිය ප්‍රවාහය ඇසුරෙන් කාන්දුවීම් සහ විදීම් රූපසටහනක් මගින් විමසන්න. ( ලකුණු 04)

II. දල ප්‍රාග්ධන සම්පාදනයේ සංරචක පෙන්වා දෙමින් නිදසුන් සපයන්න.. (ලකුණු 04)

III. පහත ගනුදෙනු දල දේශීය නිෂ්පාදිතය තීරණය වීමේ ලා බලපාන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 04)

(අ). රජය විසින් විශ්‍රාම වැටුප් ගෙවීම

(ආ). ස්ථාවර තැන්පතු වෙනුවෙන් පොලිය උපයා ගැනීම.

(ඇ). වී මෝල් හිමියන්ගේ තොග විශාල වශයෙන් ඉහළ නංවා ගැනීම.

(ඈ). පුද්ගලයන් විසින් සමාගමක කොටස් මිලදී ගැනීම.

(ලකුණු 1×4= 04 )

IV. සංවෘත ආර්ථිකයක ස්වාධීන පරිභෝජනය 200කි. ආන්තික පරිභෝජන නැඹියාව 0.8කි. රජයේ මිලදී ගැනීම් 130කි. රජයේ ස්වාධීන බදු 100කි.

(අ). පරිභෝජන ශ්‍රිතය හා ඉතුරුම් ශ්‍රිතය ගොඩ නගන්න.

(ආ). සමතුලිත ජාතික ආදායමේ වටිනාකම ගණනය කරන්න.

(ඇ). බදු ගුණකයේ හා ස්වාධීන වියදම් ගුණකයේ වටිනාකම ගණනය කරන්න.

(ඈ). රජයේ මිලදී ගැනීම් 150 දක්වා වැඩි කළහොත්, සමතුලිත ආදායම වෙනස් වන ආකාරය රූප සටහනක් මගින් පෙන්වන්න.

(ලකුණු 2 ×4 = 08)



Scanned by CamScanner

## " ආ " උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න)

**06.**

I. උද්ධමනය, අවධමනය,නිරුද්ධමනය, අවපාතොන්ධමනය යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 04)

II. ණය පත් හා හර පත් මුදල් ලෙස සැලකේ ද? හේතු පහදන්න. (ලකුණු 04)

III. ආර්ථිකයක මුදල් ඉල්ලුම තීරණය කරන සාධක නම් කොට එම විචල්‍යයන් මුදල් ඉල්ලුම වැඩි කිරීමට හේතු වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 04)

IV. ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් වෙළඳපොලේ අධි හෝ ඌන ද්‍රවශීලතාවය කළමනාකරණය කරගන්නේ කෙසේද පැහැදිලි කරන්න. (ලකුණු 04)

V. ශ්‍රී ලංකා මහ බැංකුව වර්තමානයේ අනුගමනය කරන මූල්‍ය ප්‍රතිපත්ති රාමුව, අරමුණු හා ඉලක්ක පැහැදිලි කරන්න.(ලකුණු 04)

**07.**

I. රාජ්‍ය අයවැය ලේඛනයේ වර්තන සංක්‍රාම හා ප්‍රාග්ධන සංක්‍රාම අතර වෙනස උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 03)

II. ආරක්ෂක වියදම් අඩු වීම ආර්ථිකයකට බලපාන ආකාරය දක්වන්න.(ලකුණු 02)

III. ශ්‍රී ලංකාවේ පෞද්ගලික ආදායම් බද්දෙන් රජයට ලැබෙන ආදායම, රජයේ මුළු ආදායමෙන් 4%-5% තරම් සුළු ප්‍රමාණයක් වීමට හේතු මොනවාද? (ලකුණු 02)

IV. ශ්‍රී ලංකා ආණ්ඩුවේ රාජ්‍ය ණය ප්‍රමාණය ආර්ථිකය මත ඇති කල බලපෑම පිලිබඳ කුමක් කිව හැකි ද? (ලකුණු 03)

V. බාහිරතා අවම කිරීමට රජයකට ගත හැකි ක්‍රියාමාර්ග 04ක් සඳහන් කරන්න. (ලකුණු 02)

VI. කල්පිත ආර්ථිකයක කිසියම් වර්ෂයක රාජ්‍ය මූල්‍යය ට අදාළ මතු දැක්වෙන විස්තර ඔබට සපයා ඇත. ( සියළුම සංඛ්‍යා රු. බිලියන වලිනි)

| | |
|---|---|
| රජයේ බදු ආදායම | 20,000 |
| බදු නොවන ආදායම | 10,000 |
| මුළු වියදම් | 50,000 |
| ප්‍රාග්ධන වියදම් | 30,000 |
| බැංකු නොවන දේශීය ණය | 5,000 |
| විදේශ ණය හා ප්‍රදාන | 12,000 |
| ජංගම පැවරුම් | 6,000 |
| රාජ්‍ය ණය පොළී ගෙවීම් | 1,000 |
| ප්‍රාග්ධන සංක්‍රාම | 16,000 |

පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ). රාජ්‍ය ඉතුරුම්

(ආ). රජයේ පොදු පරිභෝජන වියදම

(ඇ). සමස්ථ අයවැය හිඟය

(ඈ).අයවැය කටයුතු වල ප්‍රසාරණාත්මක බලපෑම

(ලකුණු 02 × 4 = 08)



Scanned by CamScanner

**08.**

I. සාපේක්ෂ වාසිය පැහැදිලි කරමින් එය තීරණය කරන සාධක නම් කරන්න.(ලකුණු 04)

II. මෑත වර්ෂ වල ශ්‍රී ලංකාවේ අපනයන සංයුතියේ සිදු වූ ප්‍රබල වෙනස්වීම් හා ඊට හේතු සංක්ෂිප්තව පැහැදිලි කරන්න. (ලකුණු 04)

III. සඵල ආරක්ෂණ අනුපාතිකය හා නාමික ආරක්ෂණ අනුපාතිකය යන සංකල්ප විස්තර කරන්න. (ලකුණු 04)

IV. පහත ගනුදෙනු ගෙවුම් ශේෂ ලේඛණයේ ද්විත්ව සටහන් තබන ආකාරය දක්වන්න.

(අ). ගුවන් ප්‍රවාහනයෙන් ශ්‍රී ලංකාවට ලැබෙන මුදල

(ආ). ශ්‍රී ලංකාවට ලැබෙන ආමුඛ ප්‍රේෂණ

(ඇ). ලාංකික මූල්‍ය ආයතන විදේශ සුරැකුම්පත් මිලදී ගැනීම.

(ඈ).ලාංකීය සමාගමක් ඉන්දියාවේ සමාගමක වෙළඳ නාමය හා වෙළඳ ලකුණ වර්ෂ 05ක් සඳහා මිලදී ගැනීම.

(ලකුණු 1×4 = 04)

V. නම්‍ය විනිමය අනුපාතිකය හා පාලිත නම්‍ය විනිමය අනුපාතිකය අතර වෙනස විස්තර කරන්න. (ලකුණු 04)

**09.**

I. 2016 වර්ෂයේ ලෝක බැංකු වර්ගීකරණයට අනුව ප්‍රතිශීර්ෂ ආදායම පදනම් කරගනිමින් රටවල් වර්ග කර ඇති ආකාරය දක්වන්න.(ලකුණු 04)

II.

(අ). " මැදි ආදායම් උගුල" යනු කුමක්ද?(ලකුණු 02)

(ආ). මැදි ආදායම් උගුලට හසු නොවී එක පුද්ගල ආදායම ඉහළ නංවා ගැනීමට ගත යුතු ක්‍රියා මාර්ග 03ක් දක්වන්න.(ලකුණු 03)

III. ආර්ථික වෘද්ධි ක්‍රියාවලියකින් රටකට අත් වන අවාසි කවරේද? (ලකුණු 03)

IV. ඉහළ ආර්ථික වෘද්ධියක් ලඟා කරගැනීම සඳහා පොදුවේ රටක් විසින් ක්‍රියාත්මක කල යුතු ප්‍රතිපත්ති කවරේද?(ලකුණු 04)

V. ආර්ථික සංවර්ධනය මැනීමේදී යොදාගන්නා මානව සංවර්ධන දර්ශකයේ වාසි හා අවාසි 02 බැගින් ලියන්න.(ලකුණු 04)

**10.**

I. ජන සංඛ්‍යාවේ වර්ධනය කෙරෙහි බලපාන ප්‍රධාන ප්‍රජා විද්‍යාත්මක සංරචක 03 නම් කර කෙටියෙන් හඳුන්වන්න.( ලකුණු 03)

II. " ලොව වැඩියෙන්ම වියපත් වන ජනගහනය සහිත රටක් ලෙස ශ්‍රී ලංකාවද හඳුන්වයි"

(අ). ජනගහනය වියපත් වීම යනු කුමක්දැයි හඳුන්වා ශ්‍රී ලංකාව තුල මෑතකාලීනව එහි ප්‍රවණතා දක්වන්න.(ලකුණු 03)

(ආ). ශ්‍රී ලංකාව තුල සේවා නියුක්තව සිටින ශ්‍රමිකයන් හඳුනා ගත හැකි ප්‍රධාන කාණ්ඩ 05 දක්වන්න.(ලකුණු 03)

(ඇ). සේවා නියුක්තිකයන් නිෂ්පාදන අංශ අතරේ බෙදී ගොස් ඇති ආකාරය ප්‍රතිශතාත්මකව දක්වන්න. (ලකුණු 03)

III. කිසියම් නිශ්චිත කාලසීමාවක් තුල කල්පිත ආර්ථිකයකට අදාලව පහත සඳහන් ජනගහන දත්ත සපයා ඇත.

| | |
|---|---|
| මධ්‍ය වාර්ෂික ජනගහනය | 20,000 |
| සජීවී උපත් සංඛ්‍යාව | 800 |
| මරණ සංඛ්‍යාව | 200 |
| ආගමන ( මෙරටට පදිංචියට පැමිණීම) | 400 |



Scanned by CamScanner

විගමන ( වෙනත් රටවලට පදිංචියට යාම)  150

පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ). දළ උපත් අනුපාතිකය

(ආ). දළ මරණ අනුපාතිකය

(ඇ). ශුද්ධ සංක්‍රමණ අනුපාතිකය

(ඈ). ස්වභාවික වර්ධන වේගය

(ලකුණු 1× 4 = 04)

IV. ප්‍රධාන දරිද්‍රතා සංකල්ප 02 කෙටියෙන් නම් කර කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 04)

WWW. ADVANCEDLEVELPAPERS SRI LANKA ALSCIENCEPAPERS.BLOGSPOT.COM



Scanned by CamScanner

WWW.LOL.LK


# BUY

## PAST PAPERS

071 777 4440

Buy Online - www.LOL.lk

- GCE O/L
- GCE A/L
- PAST PAPERS
- SHORT NOTES



Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

**ORDER NOW**

**075 699 9990**

**WWW.LOL.LK**

LOL.lk
Learn Ordinary Level

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

HUGE SALE – SHOP NOW




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

- GCE O/L Exam




GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART





GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00




GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00




GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00